# පාසලේ පුමිතිරි භූමිකා

## (මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් ජාතික පාසල් තුනක ගැටවර වියේ සිසුන් ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්)

# GENDER ROLES IN THE SCHOOL

## (A STUDY CONDUCTED WITH A PURPOSIVE SAMPLE OF ADOLESCENTS FROM THREE SELECTED SCHOOLS IN KANDY DISTRICT)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන අංශයේ
අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණාත්මක නිබන්ධනය
1997/1998


**එච්. එම්. බී. හේරත්**
විද්‍යා (පුහුණු)
විද්‍යාවේදී උපාධිය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට සාමාර්ථ)


පර්යේෂණ උපදේශිකාව
මහාචාර්ය පී. එච් ඒ. එන්. එස්. ජයසේන මහත්මිය
අධ්‍යාපන විද්‍යා අංශය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය
ශ්‍රී ලංකාව.


625433

# සාරාංශය

පාසලේ එදිනෙදා කටයුතු කෙරෙහි පුමිතිරි භූමිකාවලින් ඇති කරන බලපෑම විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ අභිප්‍රාය විය. ඒ සඳහා මානව වංශ විධි විවරණ ක්‍රමය යොදා ගත් අතර මහනුවර දිස්ත්‍රික්කයේ එකිනෙකට වෙනස් සමාජ පසුබිම් දෙකක පිහිටි පාසල් තුනක් ඇසුරෙන් දත්ත රැස් කරන ලදි. මේවායින් දෙකක් අර්ධ නාගරික ප්‍රදේශවල පිහිටා ඇති අතර අනෙක නාගරික ප්‍රදේශයක පිහිටා ඇත. ඒ අනුව පාසලේ එදිනෙදා චාරිත්‍ර වාරිත්‍ර, විෂය සමාගාමී කටයුතු හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමෙන් දත්ත රැස් කරන ලදි.

මීට අමතරව ලේඛන විශ්ලේෂණය, සම්මුඛ සාකච්ඡා යන ක්‍රම ද යොදා ගන්නා ලද අතර විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා සිසුන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි. මේ අනුසාරයෙන් නිරීක්ෂණයෙන් ලබා ගත් දත්තවල වලංගුතාව හා විශ්වසනීයතාව රැක ගැනීමට හැකි විය. මෙහිදී ගුණාත්මක ක්‍රමයට අදාළ දත්ත විශ්ලේෂණ ක්‍රම යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි. මෙහි පළමු පරිච්ඡේදයෙන් අධ්‍යයනය පිළිබඳ හැඳින්වීමක් ඉදිරිපත් කර ඇත. දෙවන පරිච්ඡේදයේ දැක්වෙන්නේ සාහිත්‍ය විමර්ශනයයි. තුන්වන පරිච්ඡේදය අධ්‍යයනයේ වැදගත් සංකල්ප විග්‍රහ කිරීමට යොදා ගෙන ඇත. සිව්වන පරිච්ඡේදයෙන් දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය සඳහා යොදා ගත් ක්‍රම විද්‍යාව පිළිබඳ විස්තර දැක්වේ. පස්වන පරිච්ඡේදය අධ්‍යයනයේ පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමටත් හයවන පරිච්ඡේදය පංතිකාමර කළමනාකරණ හා සංවිධානය පිළිබඳ අනාවරණ ඉදිරිපත් කිරීමටත් යොදා ගන්නා ලදි. හත්වන පරිච්ඡේදයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආශ්‍රිත තොරතුරු දක්වීමටත් අටවන පරිච්ඡේදයෙන් වර්තමාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආශ්‍රිත පාසල් පාදක ඇගයීම පිළිබඳ තොරතුරු විග්‍රහ කිරීමටත් වෙන් කර ඇත. නවවන පරිච්ඡේදය විෂය සමගාමී කටයුතු ඔස්සේ අනාවරණය වූ තොරතුරු හෙළිදරව් කිරීමට යොදා ගත් අතර, දහවන පරිච්ඡේදයෙන් නිගමන හා යෝජනා මෙන්ම අනාගත පර්යේෂණ ඉඟි ද ඉදිරිපත් කර ඇත.

මේ අනුව එළඹුණු නිගමනවලට අනුව පාසල තුළ පුමිතිරිභාවයේ පදනමින් භූමිකා විභේදනය ඉතා පැහැදිලිව පවතින බව තහවුරු විය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඇතැම් විෂයයන් උගන්වන ගුරුවරුන්ගේ වැඩි අවධානය පිරිමි ළමුන් වෙතට යොමු වූ බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. වර්තමාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලින් ඉතා වැදගත් යැයි අවධාරණය කළ පාසල් පාදක ඇගයීම් ක්‍රියවලිය සඳහා නිර්ණායක මූලික ඇගයීම් යොදා ගන්නා විට ඇතැම් නිර්ණායක සඳහා පිරිමි ළමුන්ට ද, ඇතැම් නිර්ණායක සඳහා ගැහැණු ළමුන්ටද ඉහළ ලකුණු හිමි විය. විෂය සමගාමී කටයුතුවලදී ගැහැණු ළමුන්ට ලැබුණු අවස්ථා ප්‍රමාණය ඉතා සීමිත වූ බවද, මෙයින් හෙළිවූ තවත් කරුණකි.

# SUMMARY

This ethnographic study was conducted to ascertain the effects of gender-roles in the day-to-day school activities. The research was conducted using three schools of different social backgrounds. Two of the schools are located in semi-urban areas while the other is in an urban area, in the Kandy district. The data was collected through observation of the day-to-day activities of the school co-curricular activities and teaching-learning process.

In addition data was obtained through observations. Interviews too were conducted with principals, teachers and students. In addition, an analysis of the relevant documents too was undertaken. This facilitated the task of testing the validity and reliability of the data obtained through observations. Data was analyzed using normal qualitative data analysis methods.

The first chapter provides the introduction to the study. The second chapter concentrates on the literature review while the third chapter is devoted to the analysis of the concepts relevant to the study. Fourth chapter deals with the methodology adopted for the collection of data as well as for analysis. The fifth chapter deals with the background of the study.

Chapter 6 presents the data related to classroom management and organization while chapter seven deals with the teaching-learning process in the selected schools. Data related to school based evaluation under the educational reforms is dealt in chapter eight. The co-curricular activities in the school, subjected to the study are presented in chapter nine. Chapter ten focuses on the conclusions and the recommendations along with suggestions for the future researchers.

The conclusions in details are that division of labour was very much segregated on the basis of gender, and that in the teaching-learning process, the teachers apparently paid more attention to the boys when teaching certain subjects.

On the assessment based on criteria introduced under the 1997 educational reforms marks obtained by the boys and girls varied.